# ආලේඛ්‍ය ඡායාරූපකරණය, දේශපාලන ප්‍රතිරූප හා මහජන සම්බන්ධතා

අමානි ඉරේෂිකා රූපසිංහ*

**සංක්ෂේපය**

*එදිනෙදා ජීවිතයේ දී නොයෙකුත් කාර්යභාරයන් ඉටු කර දෙන ඡායාරූපයේ නොයෙකුත් ව්‍යවහාරයන් අතර ආලේඛ්‍ය ඡායාරූපයට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. දේශපාලඥයකුගේ ප්‍රතිරූපයක් ගොඩනැංවීම හා එය සාර්ථකව පවත්වාගෙන යාම එක රැයකින් සිදු කළ හැක්කක් නොවේ. ඊට විවිධ මහජන සම්බන්ධතා ක්‍රමෝපායන් දියත් කරනු ලැබේ. එම මහජන සම්බන්ධතා විධික්‍රම අතර දේශපාලනික ලෝකයේ මහජනතාව සමග මනා මහජන සම්බන්ධතාවක් පවත්වා ගැනීමට හා දේශපාලඥයින්ගේ ප්‍රතිරූපය ගොඩනංවා ගැනීමට ආලේඛ්‍ය ඡායාරූපය නැතිවම බැරිය. මෙම ලිපිය මගින් සාකච්ඡා කරනුයේ ආලේඛ්‍ය ඡායාරූපය දේශපාලන ප්‍රතිරූප ගොඩනැංවීමට භාවිතා කරනුයේ කෙසේද? මනා මහජන සම්බන්ධතාවයක් හා ප්‍රතිරූප ගොඩනගන ආලේඛ්‍ය ඡායාරූපයක් නිර්මාණය කරගන්නේ කෙසේද යන්න පිළිබඳවයි. දේශපාලනික ලෝකයේ ලොව ජනාදරයට පත් බැරැක් ඔබාමා, නරේන්ද්‍ර මොඩි, මහින්ද රාජපක්ෂ වැනි දෙස් විදෙස් දේශපාලනික නායකයින්ගේ සාර්ථක ආලේඛ්‍ය ඡායාරූප ජනතාවගේ මතකයේ සදා රඳා පවතිනුයේ එම ආලේඛ්‍ය ඡායාරූප නිවැරදි ශිල්ප ක්‍රමයක පිහිටා අවශ්‍ය අරමුණු සාක්ෂාත් කරගන්නා ලෙස ග්‍රහණය කරගත් බැවිනි. මේ අනුව ආලේඛ්‍ය ඡායාරූපය දේශපාලනික ප්‍රතිරූප ගොඩනැංවීමෙහිලාත් සාර්ථක මහජන සම්බන්ධතා පැවැත්වීමේ ක්‍රමවිධියක් ලෙසත් වටිනා කාර්යභාරයක් ඉටු කරන බව ගම්‍ය වේ.*

* amarupasinghe@gmail.com